# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2261/2 - 2022 ජනවාරි මස 03 වැනි සඳුදා - 2022.01.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66උ වගන්තිය සමග කියවිය යුතු 66ඇ වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම**

ඌව පළාතේ පළාත් පාලන කොමසාරිස් එම්. එම්. විජේනායක වන මම, 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66 උ වගන්තිය සමග කියවිය යුතු 66ඇ වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ඌව පළාත තුළ පිහිටියා වූ බදුල්ල මහ නගර සභාවෙහි පුරප්පාඩු වී ඇති නගරාධිපති ධුරය සඳහා අලුත් නගරාධිපතිවරයකු තෝරා පත්කර ගැනීමේ කාර්යය සඳහා වන රැස්වීම 2022ක් වූ ජනවාරි මස 11 වැනි දින ප. ව. 2.00ට බදුල්ල මහ නගර සභාව, බදුල්ල යන ලිපිනයේ පිහිටි බදුල්ල මහ නගර සභාවේ සභා ගර්භය යන ස්ථානයේ දී කැඳවනු ලබන බව මෙයින් නිවේදනය කරමි.

එම්. එම්. විජේනායක,<br>
පළාත් පාලන කොමසාරිස්,<br>
ඌව පළාත.

2022 ක් වූ ජනවාරි මස 03 වැනි දින,<br>
බදුල්ල, මාටින් සිල්වා මාවතේ පිහිටි,<br>
ඌව පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ දී ය.

EOG 01-0357


1A - PG 5679 — 15 (2021/12)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.